සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொளகை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊමේල්-
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර .රාජගිරිය .இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. / எனது இல: / My No.: ED/02/02/23-I

ඔබේ අංකය. / உமது இல: / Your No.:

දිනය / திகதி / Date: 2020.01.

සු.කො./නි.සු.කො./ස.සු.කො./සු.අධිකාරි/
සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
සුරාබදු සැරයන් හා නියාමකවරුන් වෙත

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු සැරයන් හා සුරාබදු නියාමක තනතුරුවලට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම් පත් කැඳවීම - 2017 පළමු භාගය (2017.06.30 දිනට පෙර බඳවාගත් නිලධාරින්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.)</u>**

සුරාබදු සැරයන් හා නියාමකවරුන් වෙනුවෙන් 2017 පළමු භාගයේ පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, මෙම විභාගයට අදාල ලිඛිත පරීක්ෂණය ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ද වාචික පරීක්ෂණය සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ද පවත්වනු ලැබේ.

(I) සුරාබදු නියාමකවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :
- පළමුවැනි ප්‍රශ්න පත්‍රය (ලිඛිත) - (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)
- දෙවන ප්‍රශ්න පත්‍රය (ලිඛිත) - (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)
- සී පරීක්ෂණය (වාචික)

(II)සුරාබදු නියාමකවරුන්/ සුරාබදු සැරයන්වරුන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය:
- පළමුවැනි ප්‍රශ්න පත්‍රය (ලිඛිත) - (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)
- දෙවන ප්‍රශ්න පත්‍රය (ලිඛිත) - (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

යථෝක්ත විභාගය සඳහා අනුගමනය කරන විභාග පරිපාටිය පහත දැක්වේ.

03. **විභාග පරිපාටිය:**

**3.1** <u>සුරාබදු නියාමකවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

(අ) පළමුවැනි ප්‍රශ්න පත්‍රය - සුරාබදු නීතිය :- (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

i. සුරාබදු ආඥා පනත, වස විස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත ඇතුළත් සුරාබදු අත්පොත

(ආ) දෙවැනි ප්‍රශ්න පත්‍රය - පරිපාලන නීතිය :- (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

i. දෙපාර්තමේන්තු නියෝග ඇතුළත් සුරාබදු අත්පොත 1 වැනි කොටස
ii. සුරාබදු නියාමක අත්පොත
iii. ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ V,VI,XII,XIV යන පරිච්ඡේද
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය
v. මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104, 165 සිට 170, 175 සිට 178, 182 සිට 184, 200 සිට 205, 315, 320, 340

(ඇ) සී පරීක්ෂණය (වාචික):-

සිංහල/දෙමළ කතා කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාව මැන බලන්නකි. සමත් වීම සඳහා ලකුණු 40% ලබා ගත යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් සඳහා වූ මෙම වාචික පරීක්ෂණය සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ .

| විෂයය | විෂය අංකය | ලකුණු | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| පළමුවැනි ප්‍රශ්න පත්‍රය - සුරාබදු නීතිය | 01 | 100 | පැය 03 | 40 |
| දෙවැනි ප්‍රශ්න පත්‍රය - පරිපාලන නීතිය | 02 | 100 | පැය 03 | 40 |
| සී පරීක්ෂණය (වාචික පරීක්ෂණයකි) | 03 | 100 | | 40 |

**3.2** <u>සුරාබදු නියාමකවරුන්/ සුරාබදු සැරයන්වරුන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

(අ) පළමුවැනි ප්‍රශ්න පත්‍රය - සුරාබදු නීතිය :- (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

සුරාබදු ආඥා පනත, වස විස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත, දෙපාර්තමේන්තු නියෝග හා සුරාබදු නිවේදන

(ආ) දෙවැනි ප්‍රශ්න පත්‍රය - මූලික නීතිය :- (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

නීතිය, අපරාධ නඩු විධාන සංග්‍රහය, ලංකා දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත සම්බන්ධව දෙපාර්තමේන්තු නියෝග 378 හි සඳහන් විෂය නිර්දේශය

| විෂය | විෂය අංකය | ලකුණු | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| පළමුවැනි ප්‍රශ්න පත්‍රය - සුරාබදු නීතිය | 01 | 100 යි | පැය 03 | 40 |
| දෙවැනි ප්‍රශ්න පත්‍රය - මූලික නීතිය | 02 | 100 යි | පැය 03 | 40 |

**04 . අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම :-**

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

ඒ අනුව, පිළියෙල කරන ලද අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් අදාළ අධීක්ෂණ නිලධාරීන් මගින් 2020.02.03 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, නො.353, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**4.1** **විභාග ගාස්තු :-**

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය සඳහා හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවකට සම්පූර්ණ විභාගය සඳහා රු.500.00

(ඇ) එක් විෂයකට පමණක් පෙනී සිටීම සඳහා රු.200.00

**05.** යම් අපේක්ෂකයෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිව විභාගයට ඉදිරිපත් වුවහොත් ඔහුගේ /ඇයගේ ප්‍රතිඵල වලංගු සේ පිළිනොගැනේ.

**06.** සුදුසුකම් ලත් විභාග අපේක්ෂකයින්ට විභාග අංකය,විභාගය පැවැත්වෙන දිනය හා වේලාව අයදුම්පත්වල සඳහන් රාජකාරි ලිපිනය අනුව දැනුම් දෙනු ලැබේ. ඊට පෙර ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් කල් ඇතිව ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

2020/01/16

ජේ. බෝදරගම
සුරාබදු කොමසාරිස් ජනරාල්

**ජේ. බෝදරගම**
**සුරාබදු කොමසාරිස් ජනරාල්**

පිටපත්:-1. ප්‍රධාන ගණකාධිකාරි

2. සියලුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්/සුරාබදු අධිකාරිවරුන් :-

(විභාග අපේක්ෂකයින් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල් වෙනුවෙන් පොදු 172 ලදුපතක් නිකුත් කළ යුතු අතර එසේ එකතු වන මුදල් ලංකා බැංකුවේ තැප්‍රෝබේන් ශාඛාවේ අංක 0007041628 දරණ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කර අදාළ විස්තර 2020.02.03 දිනට පෙර ප්‍රධාන ගණකාධිකාරි වෙත වාර්තා කළ යුතුය. )